# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## 2003 අංක 01 දරණ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිති සහ පීඨ ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථා මාලාව

## 1 කොටස

1985 අංක 07 සහ 1988 අංක 26 දරණ පනත්වලින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 112 (3) වගන්තිය සමග කියවිය යුතු 135 වගන්තිය යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සම්පාදිත අතුරු ව්‍යවස්ථාව.

1 මේ අතුරු ව්‍යවස්ථාව ' 2003 අංක 01 දරණ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථාව' යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2003 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන්නේය. මෙම අතුරු ව්‍යවස්ථාව මීට කලින් ශිෂ්‍ය සමිති නිලවරණ පිළිබඳ විෂයය අළලා නිකුත් කර තිබිය හැකි වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක් හෝ රෙගුලාසියක් අභිබවා සිටින්නේය.

2 ( මෙහි මින්මතු 'පනත' යනුවෙන් සඳහන් කරනු ලබන) 1975 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත මගින් ( සංශෝධිත ) හෝ වෙනයම් සාධන පත්‍රයක් මගින් ප්‍රධාන විධායක නිලධාරි වෙත පවරන ලද හෝ නියම කරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය මෙම අතුරු ව්‍යවස්ථාවලියේ කිසිවකින්, කිසිදු ආකාරයකින් හීන කරවන ලෙසට වටහා නොගත යුතුය.

3 (1) මෙම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වීම මත මෙම අතුරු ව්‍යවස්ථාවේ 3(11) සහ 3 (III) අනුජේදවල සලසනු ලැබ ඇති විධිවිධාන ප්‍රකාරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සමිති සහ පීඨ ශිෂ්‍ය සමිති සංස්ථාපනය කරනු ලැබිය යුතුය.

(11) 1988 අංක 26 දරණ විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ උප ලේඛනයෙන් නිශ්චිතව දක්වා ඇති 1(1) , 1(2), 2 සහ 3 වගන්තිවලින් විධිවිධාන සලසා ඇති පරිදි පේරාදෙණිය විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියට, සිය සංයුතිය, කාර්ය සහ කර්තව්‍ය සඳහා අධිකාර බලය ලැබෙන්නේය.

(111) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ එක් එක් අධ්‍යයන පීඨයක් සඳහා පීඨ ශිෂ්‍ය සමිතියක් තිබිය යුතුය. 1988 අංක 26 දරණ විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ උප ලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති 6 (1), 6(2), 6(3) සහ 07 වගන්තිවල විධිවිධාන සලසා ඇති පරිදි එම පීඨ ශිෂ්‍ය සමිති තමන්ගේ සංයුතිය, කාර්ය සහ කර්තව්‍යයන්ගේ අධිකාර බලය ලබා ගනී.

## 11 කොටස

4 පනත මගින් හෝ වෙනත් යම් සාධන පත්‍රයක් මගින් හෝ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය මත පවරන ලද හෝ නියම කරන ලද හෝ බලතල, කාර්ය සහ කර්තව්‍යයන්ගේ පොදු අදාලත්වයට අගති විරහිතව, මෙම අතුරු ව්‍යවස්ථාවේ පරිපාලනය සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පාලක සභාව වගකිව යුතු වන්නේය.

….. 02

5 **පීඨයක ශිෂ්‍යයෙක්,**

(අ) පූර්ණකාලීන උපාධි අපේක්ෂක ශිෂ්‍යයෙකු වශයෙන් නිසියාකාරව ලියාපදිංචි කොට ඇතුළත් කරගනු ලැබ නොමැත්තේ නම් හෝ නිලවරණය පැවැත්වෙන අධ්‍යයන වර්ෂය තුළ අදාළ පීඨයෙහි අධ්‍යයන පාඨමාලාවක් නොහදාරයි නම් හෝ ;

(ආ) පීඨයෙන් සහ / හෝ විශ්වවිද්‍යාලයෙන් ශිෂ්‍ය භාවය අත්හිටවනු ලැබ ඇත්තේ නම් හෝ ;

(ඇ) ඡන්දය දෙන අවස්ථාවේදී සිය අනන්‍යතාවය තහවුරු කිරීමට අසමත් වන්නේ නම් හෝ ;

ඡන්දයකදී ඡන්දය පාවිච්චි කිරීමට හෝ ඡන්දය සඳහා ඉදිරිපත් වීමට හෝ සුදුසුකම් නොලබන්නේය.

6. **මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යාර්ථයන් සඳහා,**

ලියාපදිංචි ශිෂ්‍යයෙකු යනුවෙන් අදහස් කරනු ලබන්නේ කිසියම් අධ්‍යයන වර්ෂයක් සඳහා විශ්වවිද්‍යාලයීය ලියාපදිංචිය ලබාගෙන විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පාඨමාලාවක් සඳහා ඇතුළත් කරගනු ලැබ ඇති කිසියම් උපාධි අපේක්ෂකයෙකු හෝ කිසියම් අධ්‍යයන වර්ෂයක් සඳහා හෝ වෙනත් අධ්‍යයන කාල පරිච්ඡේදයක් සඳහා හෝ කලින් කරනු ලැබූ ශිෂ්‍යයෙකි.

7 (1) එක් එක් අධ්‍යයන වර්ෂයක් ඇරඹි දින සතක් ඇතුළත විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විසින් විශ්වවිද්‍යාල සීමාවන් ඇතුළත,

(අ) එක් එක් පීඨ ශිෂ්‍ය සමිතියේ නම,

(ආ) එම එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා තෝරාගත යුතුව ඇති නිලධරයන්ගේ තනතුරු නාම සහ අනෙක් සාමාජිකයන්ගේ සංඛ්‍යාව

(ඇ) එබඳු එක් එක් පීඨ ශිෂ්‍ය සමිතියට නිලධරයන් සහ වෙනත් සාමාජිකයන් තෝරා ගැනීම සඳහා පැවැත්වෙන නිලවරණයකදී ඡන්දය පාවිච්චි කිරීමට සුදුසුකම් ලබන සිසුන්ගේ නම් හා ලියාපදිංචි අංකය ද ඇතුළත් කරමින් දැන්වීමක් ප්‍රසිද්ධ කළයුතුය.

8 එක් එක් පීඨ ශිෂ්‍ය සමිතියට නිලධාරින් හා වෙනත් සාමාජිකයන් තෝරාගැනීමේ නිලවරණය වෙනුවෙන් එම නිලවරණය පැවැත්වීම සඳහා පුද්ගලයෙකු (මෙහි මින්මතු නිලවරණ නිලධාරියා වශයෙන් හඳුන්වනු ලබන) ඔහුගේ නම හා තනතුරු නාමය සහිතව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරි විසින් නම් කළ යුතුය. මෙම කර්තව්‍යයෙහි ලා කිසියම් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් කිහිප දෙනෙකු හෝ සහාය කර ගැනීමට නිලවරණ නිළධාරීට හැකි වන්නේය.

9 (1) එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය වෙනුවෙන්, එම පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධරයන් හා

අනෙක් සාමාජිකයන් තෝරා ගැනිමේ නිලවරණය සඳහා නිලවරණ නිලධාරි විසින් නාම යෝජනා භාර ගැනිම අවසන් කරනු ලබන වේලාව, ස්ථානයක් හා දිනයක් විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරි විසින් නියම කරනු ලැබිය යුතුය. එම දිනය මෙම අතුරු ව්‍යවස්ථාවේ 7 (1) වගන්තිය යටතේ දැන්වීම ප්‍රසිද්ධ කරනු ලබන දින සිට දින 08 ක් ඉකුත්වීමෙන් පසුව, නමුත් දින 14 ක් ඉකුත් වීමට පෙරාතුව යෙදෙන දිනයක් විය යුතුය.

(11) එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය වෙනුවෙන් නාම යෝජනා භාරගැනිම සම්බන්ධයෙන් නියම කරනු ලබන දිනය, වේලාව හා පිළියෙල කරන ලද ස්ථානය, විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි විසින් විශ්වවිද්‍යාල සීමාව ඇතුළත ප්‍රසිද්ධ කළයුතුය.

10 (1) පීඨ ශිෂ්‍ය සමිතියක නිලවරණයක් සඳහා ඡන්දය පාවිච්චි කිරීමට සුදුසුකම් ලබා ඇති ලියාපදිංචි සෑම උපාධි අපේක්ෂක ශිෂ්‍යයෙක්ම එම පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධරයෙකු හෝ සාමාජිකයෙකු වශයෙන් තෝරා ගැනීමේ අපෙක්ෂකත්වයට නම් කරනු ලැබීමට සුදුසුකම් ලබන්නේය. එතෙකුදු වුවත්, විෂමාචාරයක් සම්බන්ධයෙන් වරදකරු වී ඇති කිසිම ශිෂ්‍යයෙක් පීඨ ශිෂ්‍ය සමිතියක නිලධරයෙකු හෝ සාමාජිකයෙකු වශයෙන් තෝරා ගැනීමේ අපේක්ෂකත්වයට නම් කරනු ලැබීමට සුදුසුකම් නොලබන්නේය.

(11) යෝජකයන් හා ස්ථිරකරුවන්, තමන් විසින් නම් කරනු ලබන අපේක්ෂකයන් අයත් පීඨයේම ලියාපදිංචි උපාධි අපේක්ෂකයන් විය යුතුය.

(III) මොනයම් හෝ නිලවරණයකදී යම් සිසුවෙකු එකකට වැඩි තනතුරු සංඛ්‍යාවකට හෝ එක යෝජකයෙකුට හෝ එක ස්ථිරකරුවෙකුට හෝ වැඩි සංඛ්‍යාවක් විසින් නාම යෝජනා කරනු ලැබීමට හෝ සුදුසුකම් නොලබන්නේය.

(1v) නාම යෝජනා ඉදිරිපත් කළයුත්තේ මෙම අතුරු ව්‍යවස්ථාවේ උපලේඛනය 1 හි දක්වනු ලබන ආකෘතියක වේ. නාම යෝජනා පත්‍රයෙහි යෝජකගේ සහ ස්ථිරකරුගේ නම් ද, ඔවුන්ගේ ශිෂ්‍ය ලියාපදිංචි අංකය ද ඇතුලත් විය යුතු අතර, නාම යෝජිත විසින් නිලවරණයට ඉදිරිපත් වීමට තම එකඟත්වය ප්‍රකාශ කිරීමේ සංකේතයක් වශයෙන් සිය අත්සන එහි යෙදිය යුතුවේ.

(v) මෙසේ ලැබෙන නාම යෝජනා පත්‍ර, නාම යෝජනා භාරගන්නට යෙදුන දිනට පසුව දින, නිලවරණ නිළධාරි විසින් පීඨ දැන්වීම් පුවරු මත ප්‍රදර්ශනය කරනු ඇත.

(vi) නාම යෝජනා කරනු ලැබ ඇති පුද්ගලයන් කෙරෙහි විරෝධතා ඇතොත්,. එම විරුද්ධතාවයට පිළිගත හැකි හේතු ඉදිරිපත් කරමින්, නාම යෝජනා ප්‍රදර්ශනය කිරීමට පසුව එක් දිනයක් ගතවන්නට පෙරාතුව එම පීඨයේ යම් ලියාපදිංචි සිසුවෙකු විසින්, නිලවරණ නිලධාරි වෙත ඉදිරිපත් කළයුතුවේ. නාම යෝජනාවක් වලංගු ද නැත් ද යන්න තිරණය කරනු ලබන්නේ ප්‍රධාන විධායක නිළධරයා විසින් වන අතර, එම තිරණය අවසන් තිරණය ද වේ.

….. 04

11 නාම යෝජනා පත්‍ර ලැබී නොමැති විටකදී, එම පීඨ ශිෂ්‍ය සමිතිය පිළිබඳව, ප්‍රධාන විධායක නිලධාරී විසින් නාම යෝජනා භාර ගැනීම සඳහා අලුත් දිනයක්, වේලාවක් සහ ස්ථානයක් නියම කරනු ලැබිය යුතුය.

12 (1) විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් එක් එක් පීඨ ශිෂ්‍ය සමිතියට නිලධාරීන් හා වෙනත් සාමාජිකයන් තෝරාගැනීම සඳහා දිනයක් නියම කළයුතුවේ. එම දිනය, එකී පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා නාම යෝජනා පත්‍ර ලබාගන්නා දින සිට දින 14 ක් ඇතුළත ගැණෙන දිනයක් විය යුතු යුතුය.

(11) එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය වෙනුවෙන් නිලධරයන් හා වෙනත් සාමාජිකයන් තේරීම සඳහා නියම කරගනු ලබන දිනය, වේලාව හා ස්ථානය ද විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විසින්, විශ්වවිද්‍යාල සීමාව ඇතුළත ප්‍රසිද්ධ කළ යුතුවේ.

(111) නිලවරණ නිළධාරී විසින් රහස් ඡන්ද මගින් නිලවරණ පැවැත්විය යුතුය. කිසියම් නිලවරණයක වලංගුභාවය සඳහා සුදුසුකම් ලැබූ ඡන්ද දායකයින්ගෙන් 50% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඡන්ද ප්‍රකාශ කළයුතුය.

13 පීඨ ශිෂ්‍ය සමිති නිලවරණයකදී තරඟ කරන එක් එක් අපේක්‍ෂකයාට, ඡන්දය පාවිච්චි කිරීමේ සහ ගණන් කිරීමේ කාලය තුළදී, ඡන්දය පවත්වන ස්ථානයේ දී තමා නියෝජනය කිරීම සඳහා ඡන්දපොල ඒජන්තවරුන් වශයෙන් සිසුන් දෙදෙනෙකු පත්කර ගැනීමට පුළුවන. එබඳු සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම පත් කරනු ලබන ශිෂ්‍යයන්ගේ නම් සහ ලියාපදිංචි අංක සඳහන් කරමින් අපේක්‍ෂකයා විසින් ඡන්දය ආරම්භ කිරීමට මත්තෙන් නිලවරණ නිලධාරී වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

එතෙකුදු වුවත්, ඡන්දය පාවිච්චි කිරීමේ හෝ ගණන් කිරීමේ හෝ මොනයම් අවස්ථාවකදී වුවද ඡන්ද පොල වෙත පෙනී සිටිය හැක්කේ ඉන් එක් ඡන්ද නියෝජිතයෙකුට පමණි.

14 (1) 1988 අංක 26 දරණ සංශෝධන විශ්වවිද්‍යාල පනතේ උප ලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා සුදුසුකම් ලැබූ සෑම ලියාපදිංචි ශිෂ්‍යයෙකුටම, පීඨ ශිෂ්‍ය සමිති නිලවරණයකදී එක් තනතුරක් සඳහා එක් අපේක්‍ෂකයෙකුට ද, එම පීඨ ශිෂ්‍ය සමිතියට තෝරාගනු ලැබීමට නියමිත අනෙකුත් සාමාජික සංඛ්‍යාවට සමාන අපේක්‍ෂකයන් සංඛ්‍යාවකට ද, ඡන්දය දීමට හිමිකම් තිබිය යුතුය.

(11) කිසියම් නිලවරණයකදී ප්‍රකාශ කොට ඇති ඡන්ද සංඛ්‍යාව ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ලැබූ මුළු සංඛ්‍යාවෙන් 50% කට වඩා අඩු වූ විට එම නිලවරණය වලංගු නොවන නිලවරණයක් ලෙස නිලවරණ නිලධාරී විසින් ප්‍රකාශයට පත්කරනු ලබයි.

(111) කිසියම් තනතුරක් සම්බන්ධයෙන් එක් නාම යෝජනා පත්‍රයක් පමණක් ලැබීඑය පිලිගත් අවස්ථාවකදී අදාල අපේක්ෂකයා එම තනතුරට තෝරාපත් කරගත් බව නිලවරණ නිලධාරී විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.

(iv) එක් එක් නිලය සඳහා නාම යෝජනා පත්‍ර දෙකක් හෝ වැඩි ගණනක් ලැබී ඇති අවස්ථාවකදී ඒ ඒ නිලය සඳහා ඉහළම ඡන්ද සංඛ්‍යාවක් ලද අපේක්ෂකයා තෝරා පත්කර ගනු ලැබූ බව නිලවරණ නිලධාරියා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.

(v) එක් එක් පීඨය සඳහා නිලවරණයකදී තෝරාගනු ලබන සාමාජිකයින් සංඛ්‍යාව යම් තරමක් වේද, එම සංඛ්‍යාවට සමාන වන තෙක් අවරෝහණ ක්‍රමයට වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගන්නා අපේක්ෂකයන්, සාමාජිකයන් වශයෙන් තෝරා පත් වී ඇති බව නිලවරණ නිලධාරියා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.

(vi) නිලධරයෙකු හෝ වෙනත් සාමාජිකයෙකු හෝ තෝරා ගැනීම සඳහා පැවැත්වෙන නිලවරණයක දී අපේක්ෂකයන් දෙදෙනෙකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින් ලබාගෙන ඇති ඡන්ද සංඛ්‍යාව අතර සමානත්වයක් ඇති බව පෙනී යන අවස්ථාවකදී තෝරා ගතයුතු නිලධරයා / සාමාජිකයා කුසපත් ඇදීමෙන් නිශ්වය කරනු ලැබිය යුතුය.

(vii) පීඨ ශිෂ්‍ය සමිතියේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වශයෙන් ප්‍රධාන විධායක නිලධාරී විසින් පත් කරගනු ලැබීම සඳහා පීඨාධිපතිගේ අනුමැතිය සහිතව පීඨයේ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙකු නිලධරයන් තේරීම අවසානයේ දී පීඨ ශිෂ්‍ය සමිතිය විසින් නම් කරනු ලැබිය යුතුය.

15 (1) පීඨ ශිෂ්‍ය සමිතියක එක් එක් නිලධරයෙකු හෝ සාමාජිකයෙකු, තමන් තෝරාගනු
ලබන දින සිට එසේ තෝරාගනු ලැබූ අදාළ අධ්‍යයන වර්ෂයේ අවසන දක්වා එම නිලය දැරිය යුතුවේ.

එතෙකුදු වුවත් අදාළ නිලධාරියාගේ හෝ සාමාජිකයාගේ නිල කාලය දීර්ඝ කිරීමේ අභිමතානුසාරී බලය පාලක සභාව සතුය.

(II) එම නිලයටම නැවත තෝරා පත්කරනු ලැබීමට කිසිදු සිසුවෙකු හිමිකම් නොලැබිය යුතුය.

(III) කිසියම් නිලධරයෙකු හෝ සාමාජිකයෙකු ;

(අ) තවදුරටත් ශිෂ්‍යයෙකු නොවන්නේ නම් හෝ

(ආ) ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත සිය අත්සන යටතේ ලිඛිතව දන්වා තනතුරෙන් ඉල්ලා අස්වේ නම් හෝ

(ඇ) විෂමාචාර ක්‍රියාවක් සම්බන්ධයෙන් වරදකරු වේ නම් හෝ

ඔහුගේ නිලය පුරප්පාඩු වූවාසේ සැලකිය යුතුය.

(1v) පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධරයෙකුගේ / සාමාජිකයෙකුගේ හෝ තනතුරු පුරප්පාඩු
වන අවස්ථාවකදී නිලවරණ නිලධාරියා මෙම අතුරු ව්‍යවස්ථාවේ කලින් විධිවිධානවලට අනුකූලව ප්‍රධාන විධායක නිලධාරී විසින් තීරණය කරනු ලබන පරිදි එම පුරප්පාඩුව පිරවීම සඳහා පුද්ගලයෙකු තේරීම පිණිස නිලවරණයක් පැවැත්වීමට කටයුතු ආරම්භ කළ යුතුය. එසේ තෝරාගනු ලැබූ පුද්ගලයා ස්වකීය පූර්ව ප්‍රාප්තිකයාගේ නිල කාලයෙන් නොගෙවුනු කාල පරිච්ඡේදය සඳහා එම තනතුර දරන්නේය.

16 (1) **පීඨ ශිෂ්‍ය සමිතියේ සභාපතිගේ කාර්ය හා කර්තව්‍ය ;**

(අ) පීඨ ශිෂ්‍ය සමිති සියල්ලකම මුලසුන දැරීම,

(ආ) පීඨ ශිෂ්‍ය සමිතියේ තීරණ ක්‍රියාත්මක කිරීම සහ

(ඇ) පීඨ ශිෂ්‍ය සමිතියේ රැස්වීම් කැඳවීම - විය යුතුය.

(11) **පීඨ ශිෂ්‍ය සමිතියේ උප සභාපතිගේ කාර්ය හා කර්තව්‍ය ;**

(අ) සභාපති නොපැමිණි අවස්ථාවලදී පීඨ ශිෂ්‍ය සමිතියේ කිසියම් රැස්වීමක මුලසුන දැරීම,

(ආ) සභාපතිගේ රාජකාරි ඉටු කිරීමෙහි ලා ඔහුට සහය වීම සහ

(ඇ) පීඨ ශිෂ්‍ය සමිතිය විසින්, ඔහුට පවරනු ලැබ ඇති වෙනත් කිසියම් රාජකාරි හෝ කාර්ය ඉටු කිරීම - විය යුතුය.

(111) **පීඨ ශිෂ්‍ය සමිතියේ ලේකම් ගේ කාර්ය හා කර්තව්‍ය ;**

(අ) පීඨ ශිෂ්‍ය සමිතියේ සභා කෘතිවල ලේඛන පවත්වා ගැනීම

(ආ) සභාපතිගේ උපදෙස් මත හෝ පීඨ ශිෂ්‍ය සමිතියේ මුළු සාමාජිකත්වයෙන් 1/3 කට අඩු නොවන සංඛ්‍යාවකගේ ලිඛිත ඉල්ලීමක් ලැබුණු විට හෝ පීඨ ශිෂ්‍ය සමිති රැස්වීම් කැඳවීම

(ඇ) සභා කෘතිවල වාර්තාවල පිටපතක් පීඨාධිපති වෙත ලබා දෙන බව සහතික කිරීම සහ

(ඈ) පීඨයේ කිසියම් සිසුවෙකුට පරීක්ෂා කිරීම සඳහා සභා කෘතිවල වාර්තා ලබාදෙන බව සහතික කිරීම ද - විය යුතුය.

(1v) **පීඨ ශිෂ්‍ය සමිතියේ කණිෂ්ඨ භාණ්ඩාගාරික ගේ කාර්ය හා කර්තව්‍ය** ;

(අ) පීඨ ශිෂ්‍ය සමිතියේ අරමුදල් භාරයේ තබාගැනීම,

(ආ) සියලුම ආදායම් හා වියදම්, එම ගිණුම් පවත්වා ගැනීමට අදාළ යම් නීතියකට යටත්ව, එම කාර්යය සඳහා පවත්වා ගනු ලබන පොත්වල නියමාකාරයෙන් වාර්තා කර ඇති බවට වග බලා ගැනීම.

(ඇ) පීඨ ශිෂ්‍ය සමිතියට කිසියම් ගෙවීමක් කළ විට එම ගෙවීම පිළිබඳව සතියක් ඇතුළත දි ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත දැනුම් දීම.

……… 07

(ඈ) ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකගේ අනුමැතිය ඇතිව පීඨ ශිෂ්‍ය සමිතියේ අරමුදල්වලින් ගෙවීම් කිරීම.

(ඉ) පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධරයන් තේරීම් දින සිට මසක කාලයක් තුළදී, එම නිලධාරින් සමඟ සාකච්ඡා පැවැත්වීමෙන් පසුව අධ්‍යයන වර්ෂය සඳහා අයවැය වාර්තාවක් පිළියෙල කිරීම,

(ඊ) අවශ්‍ය විටකදී පරිපූරක ඇස්තමේන්තු පිළියෙල කිරීම.

(උ) එක් එක් අධ්‍යයන වාරයේ අවසාන දින වනවිට පීඨ ශිෂ්‍ය සමිතියේ ජංගම සහ පූර්වානුමතය කළ මුදල් තත්වය පිළිබඳව වාර්තාවක්, අදාළ සෑම වාරයකම අවසන, අන්තිම මාසය තුළදී පීඨ ශිෂ්‍ය සමිතියට ඉදිරිපත් කිරීම සහ

(ඌ) පීඨ ශිෂ්‍ය සමිතිය තෝරාගනු ලැබූ අධ්‍යයන වර්ෂය සඳහා එම ශිෂ්‍ය සමිතියේ ආදායම් වියදම් ප්‍රකාශනයක් සහ එම වර්ෂයේ අවසාන දිනට ශේෂ පත්‍රයක් ද, එකී වර්ෂය අවසානයේ සති 02 ක් ඇතුළත දී ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික මඟින් විගණකවරයකු වෙත ඉදිරිපත් කිරීම විය යුතුය.

## 111 වන කොටස

17. (1) ප්‍රධාන විධායක නිලධාරියා විසින්, විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ ප්‍රථම රැස්වීම පැවැත්වීම සඳහා දිනයක් යෙදිය යුතු අතර, එම රැස්වීමේදී පීඨ ශිෂ්‍ය සමිතිවල සියලුම සාමාජිකයින් විසින්, විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ නිලධරයන් (තමන් අතුරෙන්ම) තෝරා ගතයුතු වේ.

එම දිනය, මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 කොටසේ අදාළ වගන්තිවලට අනුව පීඨ ශිෂ්‍ය සමිතියේ නිළධරයන් හා වෙනත් සාමාජිකයන් තෝරා ගනු ලැබීමෙන් සති 02 ක කාලයක් ඇතුළත එළඹෙන දිනයක් විය යුතුය.

(11) මෙම රැස්වීමේ කාර්යාර්ථයන් සඳහා, රහස් ඡන්දයක් මගින් නිලධරයන් තේරීමේ නිලවරණය පැවැත්වීම පිණිස තේරීම් භාර නිලධාරි වශයෙන් විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියෙකු, ප්‍රධාන විධායක නිලධාරයා විසින් නම් කරනු ලැබිය යුතුය. හෙතෙම එම රැස්වීමේ මුලසුන දැරිය යුතු අතර, නිර්බාධිතව නිලවරණය පැවැත්වීම සම්බන්ධයෙන් අවශ්‍ය සියලුම පියවර ගතයුතුය.

(111) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වශයෙන් ප්‍රධාන විධායක නිලධාරි විසින් පත්කර ගනු ලැබීම සඳහා ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙකු නිලධරයන් තේරීම අවසානයේදී විශ්වවිද්‍යාල සමිතිය විසින් නම් කරනු ලැබිය යුතුය.

(1v) තේරීම් භාර නිලධාරි විසින් ප්‍රධාන විධායක නිලධාරි වෙත, යථෝක්ත නිලවරණය සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුවේ.

……….. 08

18. (1) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ එක් එක් නිලධරයා, ඔහුව තෝරාගනු ලබන දින සිට අදාළ අධ්‍යයන වර්ෂයේ අවසානය දක්වා තම නිලය දැරිය යුතුවේ.

(11) කිසිදු සාමාජිකයෙකු එම නිලයටම නැවත වරක් තේරී පත්වීමට සුදුසුකම් නොලබයි.

(III) යම් නිලධරයකු ;

(අ) ඉදිරියටත් ශිෂ්‍ය භාවයේ රැදී නොසිටින්නේ නම් හෝ

(ආ) සිය අත්සනින් යුතුව ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත, නිලයෙන් ඉල්ලා අස්වීමේ ලියවිල්ලක් භාරදෙන්නේ නම් හෝ

(ඇ) විෂමාචාර ක්‍රියාවක් සම්බන්ධයෙන් වරදකරු වේ නම් හෝ

ඔහුගේ නිලය පුරප්පාඩු වී ඇති බවට සලකනු ලැබේ.

(1v) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියක නිලයක් පුරප්පාඩුවක් ඇති විටකදී විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධරයා තීරණය කර ඇති පරිදි නිලවරණ නිලධාරියා විසින්, නිලධරයෙකු / සාමාජිකයෙකු තේරීම සඳහා නිලවරණයක් පැවැත්වීම පිණිස කටයුතු ආරම්භ කළයුතුය. එසේ තෝරගනු ලැබූ පුද්ගලයා ස්වකීය පූර්වප්‍රාප්තිකයාගේ නිල කාලයෙන් නොගෙවුනු කාල පරිච්ඡේදය සඳහා එම තනතුර දරන්නේය.

19 **(1) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ සභාපතිගේ කාර්ය හා කර්තව්‍ය ;**

(අ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිති සියල්ලකම මුලසුන දැරීම

(ආ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ තීරණ ක්‍රියාත්මක කිරීම සහ

(ඇ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ රැස්වීම් කැඳවීම - විය යුතුය.

**(ii) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ උප සභාපතිගේ කාර්ය හා කර්තව්‍ය ;**

(අ) සභාපති නොපැමිණි අවස්ථාවලදී විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ කිසියම් රැස්වීමක මුලසුන දැරීම,

(ආ) සභාපතිගේ රාජකාරි ඉටු කිරීමෙහිලා ඔහුට සහාය වීම සහ

(ඇ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතිය විසින්, ඔහුට පවරනු ලැබ ඇති වෙනත් කිසියම් රාජකාරි හෝ කාර්ය ඉටුකිරීම - විය යුතුය.

(III) **විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ ලේකම් ගේ කාර්ය හා කර්තව්‍ය ;**

(අ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ සභා කෘතිවල ලේඛන පවත්වා ගැනීම

(ආ) සභාපතිගේ උපදෙස් මත හෝ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ සියළු සාමාජිකත්වයෙන් 1/3 කට අඩු නොවන සංඛ්‍යාවකගේ ලිඛිත ඉල්ලීමක් මත විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිති රැස්වීම කැඳවීම

……….. 09

(ඈ) සභා කෘතිවල වාර්තාවල පිටපතක් විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරි වෙත ලබාදෙන බව සහතික කිරීම සහ

(ඇ) විශ්වවිද්‍යාලයේ කිසියම් සිසුවෙකුට පරීක්ෂා කිරීම සඳහා සභා කෘතිවල වාර්තා ලබාදෙන බව සහතික කිරීම ද - විය යුතුය.

**(IV) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ කණිෂ්ඨ භාණ්ඩාගාරික ගේ කාර්ය හා කර්තව්‍ය ;**

(අ) සියලු ආදායම් හා වියදම්, එම ගිණුම් පවත්වා ගැනීමෙහි ලා අදාළ නීති හා රෙගුලාසිවලට යටත් ව, එම කාර්යය සඳහා පවත්වා ගනු ලබන පොත්වල නියමාකාරයෙන් වාර්තා කර ගිණුම්ගත කර ඇති බවට වග බලා ගැනීම.

(ආ) ශිෂ්‍ය සමිතියට ගෙවනු ලබන යම් මුදලක් වෙතොත් එම ගෙවීම පිළිබඳව සතියක් ඇතුළත දී ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත දැනුම් දීම.

(ඇ) ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික ගේ අනුමැතිය ඇතිව ශිෂ්‍ය සමිතියේ අරමුදල්වලින් මුදල් ගෙවීම් කිරීම.

(ඈ) ශිෂ්‍ය සමිතියේ නිලධරයන් තේරීමේ දින සිට මසක් ඇතුලත අදාළ අධ්‍යයන වර්ෂය සඳහා අයවැය වාර්තාවක් පිළියෙල කොට විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියට ඉදිරිපත් කිරීම. (මෙම කර්තව්‍ය සඳහා ශිෂ්‍ය සමිති නිලධාරින් සහ ශිෂ්‍ය සමිතියේ කිසියම් ස්ථාවර කමිටුවක් ඇත්නම් එය සමඟ ද සාකච්ඡා කළ යුතුය.)

(ඉ) අවශ්‍ය විටදී පරිපූරක ඇස්තමේන්තු පිළියෙල කිරීම.

(ඊ) ශිෂ්‍ය සමිතිය තෝරා ගනු ලැබූ අධ්‍යයන වර්ෂය සඳහා එම ශිෂ්‍ය සමිතියේ ආදායම් වියදම් ප්‍රකාශයක් සහ එම වර්ෂයේ අවසාන දිනට ශේෂ පත්‍රයක් ද, එකී වර්ෂය අවසානයේ සති 02 ක් ඇතුළත දී ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික මගින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම - විය යුතුය.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ අර්ථ නිරූපණ සම්බන්ධයෙන් යම් ගැටලුවක් වෙතොත්, පාලක සභාව වෙත යොමු කළයුතු වන අතර, පාලක සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

21. **මෙම අතුරු ව්‍යවස්ථාවේ -**

'අධ්‍යයන වර්ෂය' යනුවෙන් අදහස් වන්නේ, යම් වර්ෂයක ඔක්තෝබර් මස පළමුවන දිනෙන් ඇරඹී ඊට පසු වර්ෂයේ සැප්තැම්බර් මස 30 වෙනි දිනයෙන් අවසන් වන්නාවූ කාල පරිච්ඡේදය වේ.

'පනත' යනු, 1978 අංක 16 දරණ සංශෝධිත පනත වේ.

' විගණක' යන්නෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ හෝ යම් පීඨ ශිෂ්‍ය සමිතියක ගිණුම් විගණනය සඳහා ප්‍රධාන විධායක නිලධාරි විසින් පත්කරනු ලබන කිසියම් විගණකවරයෙකු අදහස් වේ.

……10

'පාලක සභාව' යනු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව වේ.

'පීඨාධිපති' යන්නෙන්, එක් එක් පීඨයෙහි පීඨාධිපතිවරයා හෝ අවස්ථානුකූලව පීඨාධිපති සඳහා වැඩ බලන වෙනත් පුද්ගලයෙකු හෝ අදහස් වේ.

'පීඨය' යනු පනත යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් සංස්ථාපිත කිසියම් පීඨයක් වේ.

'ප්‍රධාන විධායක නිලධාරි' යන්නෙන්, උපකුලපති හෝ අවස්ථානුකූලව උපකුලපති ධුරයෙහි රාජකාරි ඉටු කරන්නා වු වෙනත් කිසියම් පුද්ගලයෙකු හෝ අදහස් වේ.

'ලේඛකාධිකාරි' යන්නෙන්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි හෝ අවස්ථානුකූලව ලේඛකාධිකාරි වෙනුවට වැඩ බලන වෙනත් කිසියම් පුද්ගලයෙකු හෝ අදහස් වේ.

'සනාතන සභාව' යන්නෙන්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව අදහස් වේ.

'තනතුර' යන්නෙන්, ශිෂ්‍ය සමිතියක නිලධාරියෙකු හෝ කමිටු සාමාජිකයෙකු අදහස් වේ.

## 22 අතුරු ප්‍රතිපාදන

මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රථම පීඨ ශිෂ්‍ය සමිති සහ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතිය වහාම ස්ථාපිත කළයුතුය.

එතෙකුදු වුවත්, අධ්‍යයන වර්ෂය සම්බන්ධ වගන්තිය පළමුව ස්ථාපිත ශිෂ්‍ය සමිතියට අදාළ නොවිය යුතු අතර පළමුව ස්ථාපිත පීඨ ශිෂ්‍ය සමිතියෙහි හා විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියෙහි නිලධාරින්ට සහ කමිටු සාමාජිකයින්ට මෙම අතුරු ව්‍යවස්ථාවේ අනෙකුත් වගන්තීන් යටතේ 2003/2004 අධ්‍යයන වර්ෂය අවසාන වනතෙක් අදාල නිලයන් දැරිය හැකිය.